Jayatunge, Mangalika
PAPER

**ස්ත්‍රී දේව සංකල්පයෙන් විද්‍යමාන වන ප්‍රචණ්ඩ පුද්ගල මානසිකත්වය**

Mangalika Jayatunge, Department of Fine Arts, University of Kelaniya

ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ ප්‍රචලිත දේව ඇදහිලි අතර, කිරි අම්මා, පත්තිනි හා කාලීට හිමි වන්නේ ප්‍රමුඛත්වයකි. මෙම දෙවඟනන් සත් කට්ටුවක් වශයෙන් ද වෙනත් පර්යාය පදයන්ගෙන් ද හඳුන්වනු ලබන අතර, ඇදහිලි පද්ධතියක් වශයෙන් වර්ධනයට පත්ව තිබේ. ඔවුන්ගේ උපත හා ජීවිතය අළලා ගොඩනගා ඇති පුරාවෘත්ත හා ජන ප්‍රවාදයන්ගෙන් ප්‍රකට වන්නේ විවිධ කාල වකවානුවල ජීවත් වූ විවිධ ආගමික හා සමාජ කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය කෙරෙහි දක්වා ඇති නැඹුරුවයි. හින්දු සහ බ්‍රාහ්මණ ආගමිකයන් අතර ප්‍රචලිතව පවත්නා ජනප්‍රවාද ක්‍රෝධය, වෛරය හා පළිගැනීම මත ගොඩනගා ඇති අතර, එය ජන්මාන්තර වශයෙන් ඵල දරන්නේය යන අදහස ද ගැබ් කොට ඇත.

එසේම මනුෂ්‍ය වර්ගයා රෝගී බවට හා නිසරු බවට පැමිණවීමට හා කන්නලව් කළ විට සුවපත් කිරීමට ද මෙම දෙවඟනන් සතු හැකියාව පිළිබඳව ද මෙකී සමාජවල වැසියන් අතර ඇත්තේ දැඩි විශ්වාසයකි. පූර්වෝක්ත දේව සංකල්පවල ප්‍රභවය පිළිබඳ නිර්මාණය වී ඇති මූලාශ්‍රය හා එකී මූලාශ්‍රය බිහි වූ ආගමික පසුබිම පිළිබඳ විග්‍රහයකින් මනුෂ්‍යයා ප්‍රචණ්ඩත්වය කෙරෙහි දක්වන ලැදියාව වටහා ගත හැකි ය.

පත්තිනිය දෙවඟනක් බවට පත් ආකාරය සඳහන් වන ඉන්දියාවේ සංගම් යුගයේ රචිත දෙමළ වීර කාව්‍යයක් වන සිලප්පදිකාරම බෞද්ධ, ජෛන, හින්දු පදනමක් සහිත කෘතියක් වන අතර, එහි ප්‍රචණ්ඩත්වය නිරූපණය කරනුයේ පාලනයකින් යුතුව ය. සිංහලයන් අතර ප්‍රකට පන්තිස් කෝල්මුර කාව්‍යාවලිය ද ප්‍රචණ්ඩත්වය නිරූපණය කරනුයේ අවම වශයෙනි. මදුරාපුරය ගින්නෙන් දවා හළු කළේයැයි පැවසෙන පත්තිනිය සිංහල බෞද්ධයන් අතර ප්‍රකටව සිටින්නේ මතු බුදු බව අපේක්ෂාවෙන් පිරිමි ආත්මයක් ලබා ගැනීම සඳහා අඳුන් ගිරි පර්වතයේ තවුස් දම් රකිමින් සිටින්නියක ලෙසයි.

ආදී වාසීන් අතර ජනප්‍රියව පැවති තරමක බිහිසුණු බවක් ප්‍රකට කළ කිරි අම්මා ඇදහිල්ල පත්තිනි ඇදහිල්ල හා සමාග්‍රහණය වීමත් සමගම එහි තුබූ බිහිසුණු බව ගිලිහී ගියේ ය. පත්තිනිය පෙර භවයක කාලී ලෙස උපත ලබා සිටි බව පැවසෙන සිංහල බෞද්ධයන් අතර අප්‍රචලිත ජන ප්‍රවාදයක් මුලෙයිතිව් වැසියන් අතර ප්‍රචලිතව පවතින බව හියු නෙවිල් (1988) සඳහන් කරයි. අතිශය බිහිසුණු එම ජන ප්‍රවාදයෙන් පැවසෙන්නේ පත්තිනිය හය දහසක් පාණ්ඩ්‍යයන් මරා ඔවුන්ගේ අතුණු බහන් ඇද සිය ගෙළෙහි ලා ගත් බව යි. මෙම පුරාවෘත්තය නැගෙනහිර වෙරළබඩ තීරයේ දෙමළ ජාතිකයන් අතර පවා ව්‍යාප්ත වුවක් නොවේ.

සිංහල බෞද්ධයන් ජීවත් වන නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල කාලී දෙවොල් ගොඩ නැගීම අඩ සියවසක පමණ කාලයක සිට වර්ධනය වෙමින් පවතී. පත්තිනිය බෞද්ධ දෙවඟනක් බවට පත්වීම හේතුවෙන් ඕලාරික වූ ප්‍රචණ්ඩත්වයට දක්වන නැඹුරුව වෙනත් බලවේගයක් ලෙස ක්‍රියාත්මක වීමක් ලෙස ද මෙය සැලකිය හැකි ය. දෙවඟනන් සම්බන්ධ පුරාවෘත්තවල ප්‍රචණ්ඩ ස්වභාවය ඒවා බිහි වූ සමාජ සන්දර්භය සමග විශ්ලේෂණය කොට ප්‍රචණ්ඩත්වය විද්‍යමාන වන ආකාරය ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

ප්‍රමුඛ පද- පත්තිනි, කාලී, ප්‍රචණ්ඩත්වය, ඇදහිලි, පුරාවෘත්ත